## <u>මෝටර් රථවාහන රක්ෂණය - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID)</u>

**ඔප්පු වර්ගය:** මෝටර් රථවාහන රක්ෂණය

### <u>ලබා දෙනු ලබන මූලික ආවරණය:</u>

පළමුවන කොටස - වාහනයට සිදුවන අලාභ හෝ හානි (පූර්ණ රක්ෂණ ඔප්පු සඳහා පමණක් අදාළ වේ)

- අ) බාහිර අහඹුමය සිදුවීමකින්,
- ආ) ගින්න, බාහිර පිපිරීම, ස්වයං දහනය, අකුණු ගැසීම හෝ සොරකම, ගෙවල් බිඳීම,
- ඇ) ද්වේශ සහගත ක්‍රියා,
- ඈ) මහාමාර්ගයක, දුම්රිය මාර්ගයක, අභ්‍යන්තර ජල මාර්ගයක, ඔසවනයක ගෙනයද්දී

*(මූලික ආවරණය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03 බලන්න)*

දෙවන කොටස - රක්ෂිත වාහනය පැදවීම හේතුවෙන් මතුවන තෙවන පාර්ශවීය වගකීම්

- ආ) ඕනෑම තෙවන පාර්ශවීය පුද්ගලයකුට සිදුවන හදිසි අනතුරු මරණයක් හෝ ශාරීරික තුවාල සඳහා අසීමිත වගකීම්
- ආ) ඕනෑම තෙවන පාර්ශවීය දේපළකට සිදුවන හදිසි අනතුරුමය හානිය - ඔබේ ඔප්පු උපලේඛනයේ දක්වා ඇති සීමාව දක්වා

*(තෙවන පාර්ශව වගකීම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 05 බලන්න)*

### <u>ආවරණය නොවන දේ (ව්‍යතිරේක):</u>

**පළමුවන කොටසට අදාළ වේ**

- අ) වාහනයේ අනෙකුත් කොටස්වලටද හානි පමුණුවමින් අහඹුව සිදුවන අවස්ථාවේදීම හානියක් සිදුවූයේ නම් හැර ටයර් සහ ටියුබ්වලට සිදුවන අලාභ.
  ගෙවනු ලැබුයේ වුවද සමාගමේ වගකීම ටයර් සහ ටියුබ් ප්‍රතිසම්පාදනය සඳහා යන වියදමින් 50%ක් නොඉක්මවිය යුතුය.
- ආ) වාහනයක් සොරකම් කිරීමකදී හැර උපාංග, අමතර කොටස් සහ වෙනත් කොටස් සොරකම් කිරීමකදී සිදුවන හානි සහ අලාභ මෙම බැහැර කිරීම පුද්ගලික කාර් රථ සඳහා අදාල නොවේ.
- ඇ) බස් සහ කෝච් රථ ලෙස ලියාපදිංචි කර ඇති වාහනවල වාමුවා සහ කවුලු වීදුරුවලට සිදුවන අලාභ සහ හානි වෙනුවෙන් පහත දැක්වෙන අගයන්ගෙන් 10% ඉක්මවන ප්‍රමාණය
  - i. උපාංග සහ අමතර කොටස් ඇතුලුව එවන් මෝටර් රථයක රක්ෂිතයාගේ ඇස්තමේන්තු අගය
  - ii. උපාංග සහ අමතර කොටස් ඇතුලුව එවන් මෝටර් රථයක අගය
- ඈ) කුලී පදනම යටතේ භාවිතා කෙරෙන වාහනවල ලාම්පු, ටයර්, මඩ්ගාඩ්, බෆර්, බෆර් ඒප්‍රන් සහ / හෝ පින්තාරු වැඩ වෙනුවෙන්
- ඉ) භාවිතය අහිමි වීම හෝ වෙනත් අනුෂංගික අලාභ
- ඊ) ක්ෂයවීම, ගෙවීයාම, කාර්මික සහ විදුලිමය බිඳවැටීම්, අක්‍රියවීම් හෝ කැඩීයාම
- උ) අධික බර පැටවීම හෝ ආයාසය නිසා ඇතිවන හානි
- ඌ) හදිසි අනතුරක් හේතුවෙන් වාහනයට බාහිර හානියක් සිදුවී තිබුණහොත් මිස, වාහනයේ සවිකර ඇති ජැක්, බූම් ලිෆ්ට්, දොඹකරය හෝ ඒ හා සමාන උපකරණ වලට සිදුවන අලාභ හෝ හානි.

*(පළමුවන කොටස යටතේ අදාළවන බැහැරකිරීම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04 බලන්න)*

**දෙවන කොටසට අදාළ වේ**

අ) රථය පදවන ඔබ ඇතුලු රථයේ ගමන් ගන්නා ඕනෑම කෙනෙකුට සිදුවන මරණය හෝ ශාරීරික තුවාල,
ආ) ඔබ විසින් සේවයේ යොදවනු ලබන පුද්ගලයෙකු හට එසේ සේවයේ යෙදී සිටියදී සිදුවන මරණය හෝ ශාරීරික තුවාල,
ඇ) ඔබට අයත් හෝ ඔබ පවුලේ සාමාජිකයෙකු භාරයේ හෝ පාලනයේ පවතින හෝ වාහනයෙන් ප්‍රවාහනය කරන දේපළකට සිදුවන අලාභ.
ඈ) කුලියට මගීන් ගෙනයන වාහනයක් ලෙස රක්ෂිත වාහනයක ගෙන යන, එයට නගින හෝ එයින් බසින මගියෙකුට සිදුවන මරණය හෝ ශාරීරික තුවාල.
ඉ) වාහනයකට බඩු පැටවීම සඳහා ගෙන ඒමේදී හෝ වාහනයෙන් ගෙනෙන ලද බඩු ගෙනයද්දී යම් පුද්ගලයෙකුට මාර්ග සීමාවෙන් පිටතදී සිදුවන මරණය, තුවාල හෝ අලාභ.
ඊ) කම්පනය, වාහනයෙහි හා/හෝ එහි ගෙනයන බඩුවල බර හේතුවෙන් පාලමකට, කිරන පාලමකට හෝ බෝක්කුවකට සිදුවන හානිය.
උ) වාහනය භාවිතා කිරීම නිසා සිදුවූයේ නම් හැර වාහනයක සවි කර ඇති බොයිලේරුවක් පිපිරීමෙන් සිදුවන මරණය හෝ ශාරීරික තුවාල.
ඌ) වාහනයක් හෝ එවැනි මෙවලමක් හෝ යන්ත්‍රයක අඩංගු හෝ නිෂ්පාදනය කරන ලද ඕනෑම දෙයක් හෝ ඊට සම්බන්ධ කර ඇති හෝ භාවිතා කරන ලද ඕනෑම මෙවලමක් හෝ යන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීමෙන් හෝ භාවිතයෙන් සිදුවන හෝ පැන නගින මරණය, තුවාලය හෝ හානි

*(දෙවන කොටස යටතේ අදාළවන බැහැරකිරීම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 6 බලන්න)*

**පළමුවන සහ දෙවන කොටස්වලට අදාළ වේ (පොදු ව්‍යතිරේක)**

1) ඔබගේ රක්ෂණ සහතිකයේ සඳහන් භාවිතය සඳහා වන සීමාව ට අනුකූල නොවන වෙනත් ආකාරයකින් වාහනය භාවිතා කිරීම
2) අවසරලත් රියදුරෙක් හැර වෙනත් ඕනෑම පුද්ගලයකු විසින් වාහනය පැදවීම
3) මත්පැන් හෝ මත් ද්‍රව්‍ය පානය කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් පසු ඔබ හෝ අවසරලත් රියදුරෙක් විසින් වාහනය පැදවීම
4) ගිවිසුමක් මගින් බැඳී ඇති නමුත් එවැනි ගිවිසුමක් නොමැති විට බැඳීමක් නොතිබිය හැකි ගිවිසුම්ගත වගකීම. යම් ගිවිසුමක් නොවන්නට බැඳීමක් ඇති නොකර, ගිවිසුම්ගත වගකීම් ආවරණය නොවේ.
5) යුද්ධය හා සම්බන්ධිත උපද්‍රව
6) වැඩවර්ජනය, කැරළි කෝලාහල සහ මහජන කැළඹීම් (අමතර වාරිකයක් ගෙවා ආවරණය ලබාගෙන නොමැති නම්)
7) ඕනෑම ත්‍රස්තවාදී ක්‍රියාවක් (අමතර වාරිකයක් ගෙවා ආවරණය ලබාගෙන නොමැති නම්)
8) රඳවා තබා ගැනීම්, අත්පත් කර ගැනීම්, රාජසන්තක කිරීම් හෝ ඒ සඳහා දරන ඕනෑම උත්සාහයක්
9) ජලගැලීම්, කුණාටු, සුළිසුළං හෝ වෙනත් වායුගෝලීය කැළඹීම්, ගිනිකඳු පිපිරීම්, භූමිකම්පාව හෝ වෙනත් ස්වභාවික කම්පනයන් (අමතර වාරිකයක් ගෙවා ආවරණය ලබාගෙන නොමැති නම්)
10) විකිරණශීලීත්වය සහ න්‍යෂ්ටික අවි තැනීමට ගන්නා ද්‍රව්‍ය
11) ලියාපදිංචි නොකළ / ලියාපදිංචිය අවලංගු කළ වාහන

*(පොදු බැහැරකිරීම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 7 සහ 8 බලන්න)*

**<u>අමතර වාරිකයක් ගෙවා ලබාගත හැකි අමතර ආවරණ - පහත සඳහන් ආවරණ ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳව ඔබගේ ඔප්පු උපලේඛනයේ සඳහන් වනු ඇත:</u>**

1) කල්බදු වාහන සම්බන්ධයෙන් කුලී සින්නක්කර / කල්බදු ආවරණය
2) රියදුරු සහ මගීන්ට ඇතිවන හදිසි අනතුරු මරණය සහ සදාකාලික පූර්ණ අකර්මණ්‍යතාවයකදී පුද්ගල හදිසි අනතුරු ආවරණය
3) කුලියට ලබාදෙන වාහන සඳහා මගී ආවරණය
4) වාහනයේ වැටුප් ලබන සේවකයින් සඳහා කම්කරු වන්දි රක්ෂණය
5) වාහනය මගින් ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ සඳහා මාර්ගස්ථ භාණ්ඩ ආවරණය
6) වැඩවර්ජනය, කැරළි කෝලාහල සහ මහජන කැළඹීම්
7) ත්‍රස්තවාදී ක්‍රියාවන් හේතුවෙන් සිදුවන අලාභ
8) රියදුරු පුහුණු ආවරණය
9) ජලගැලීම් ඇතුළු ස්වභාවික අනතුරු ආවරණය

10) වාහනයේ බඳට කිසිදු හානියක් සිදු නොවී, සුලං‌වාමුවා හානි වූ විට ඒ සඳහා විශේෂ සුලං‌වාමුවා ආවරණය
11) ඇදගෙන යාමේ ගාස්තු
12) බැහැර කළ අයිතමයන් - කුලියට දෙන වාහනවල බැහැරකළ අයිතමයන් (ලාම්පු, ටයර්, මඩකවර, බෆර්, බෆර්බ්‍රැකට්, බෆර් ඒප්‍රන්, සහ/හෝ තීන්ත වැඩ) ආවරණය කරයි
13) තෙවන පාර්ශවීය දේපළ හානි සීමාව වැඩි කිරීම සඳහා තෙවන පාර්ශවීය දේපළ ආවරණය
14) රියදුරු පුහුණු පාසල් සඳහා රියදුරු උපකාරක පන්ති
15) වෙනත් පාර්ශවයකට කුලියට ලබාදී ඇති වාහන සඳහා කුලීකරු රියදුරු ආවරණය
16) ණය පහසුකම් යටතේ ඇති වාහන සඳහා ආයතනික ණය ආවරණය
17) පුද්ගලික ද්විත්ව කාර්ය වාහන සඳහා අමතර කොටස් සොරකම් ආවරණය
18) වාහනයට බාහිර අහඹුමය හානි සිදු නොවී තිබියදී, වාහනයට සවිකර ඇති ජැක්, බූම් ලිෆ්ට්, දොඹකර හෝ ඒ හා සමාන උපකරණ වලට සිදුවන හානි ආවරණය කිරීම සඳහා ඉදිකිරීම් ස්ථානවල භාවිතා කරන වාහන සඳහා වානිජ මෙවලම් ආවරණය

*(අමතර ආවරණ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 12 සහ 21 බලන්න)*

**<u>ප්‍රධාන ලක්ෂණය(යන්):</u>**

**හිමිකම් නොපෑමේ වට්ටම (පූර්ණ ලෙස රක්ෂිත වාහන සඳහා පමණක් යෙදේ)**

මෙම ඔප්පුව යටතේ හිමිකම්පෑමක් කර නොමැතිනම් හෝ පැන නොනගීනම් සෑම රක්ෂණ වසරක අවසානයේදීම ඔබගේ හිමිකම් නොපෑමේ වට්ටම පහත සඳහන් පරිදි වැඩි වේ.

| | මෝටර් සයිකල් සඳහා අදාළ වේ | අනෙකුත් සියලුම වාහන සඳහා අදාළ වේ |
|---|---|---|
| පෙර වසරේදී | 10% | 10% |
| අඛණ්ඩව පෙර වසර 2 කදී | 15% | 15% |
| අඛණ්ඩව පෙර වසර 3 කදී | 20% | 20% |
| අඛණ්ඩව පෙර වසර 4 කදී | 25% | 25% |
| අඛණ්ඩව පෙර වසර 5 කදී | 30% | 30% |
| අඛණ්ඩව පෙර වසර 6 කදී | 35% (උපරිමය) | 35% |
| අඛණ්ඩව පෙර වසර 7 කදී | | 40% |
| අඛණ්ඩව පෙර වසර 8 කදී | | 45% |
| අඛණ්ඩව පෙර වසර 9 කදී | | 50% |
| අඛණ්ඩව පෙර වසර 10 කදී | | 55% |
| අඛණ්ඩව පෙර වසර 11 කදී | | 60% |
| අඛණ්ඩව පෙර වසර 12 කදී | | 65% |
| අඛණ්ඩව පෙර වසර 13 කදී | | 70% |
| අඛණ්ඩව පෙර වසර 14 කදී | | 75% |
| අඛණ්ඩව පෙර වසර 15 කදී | | 80% (උපරිමය) |

වසරක් තුළ කරනු ලබන ඕනෑම හිමිකම් පෑමක් සඳහා, ඔබගේ හිමිකම් නොපෑමේ වට්ටම පසුගිය වසර තුන (03) තුළ උපයාගෙන ඇති ප්‍රතිශතයෙන් ඊළඟ වසරේදී අඩු කරනු ලැබේ.

*(හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනාව පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 05 බලන්න)*

<u>වැදගත් කරුණු කිහිපයක්</u>

**(1) වාහනය ගැන සැලකිලිමත් වීම.**

වාහනයට අලාභයක් හෝ හානියක් වීමෙන් වලකා ගැනීමට හැකි සියලු පියවර ගැනීමටත් එය මහමග පැදවීමට සුදුසු කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වාගෙන යාමටත් ඔබ විසින් පියවර ගත යුතුය. ඕනෑම අවස්ථාවකදී වාහනය හෝ ඉන් කොටසක් පරීක්ෂා කිරීමට සඳහා අපට ප්‍රවේශය තිබිය යුතුය. අනතුරක් හෝ බිඳවැටීමක් සිදුවූ අවස්ථාවකදී වාහනය නිසි ආරක්ෂාවකින් තොරව තනිකර නොදැමිය යුතු අතර තවදුරටත් අලාභ හානි සිදුවීම වළකාලීමට පියවර ගත යුතුය. අවශ්‍ය අලුත්වැඩියාව සම්පූර්ණ කිරීමට පෙර ඔබගේම කැමැත්තට වාහනය පැදවීම නිසා වාහනයට තවදුරටත් හානි සිදුවුවහොත්, එවැනි අලාභයකට අපගේ වගකීමක් නොමැත.

**(2) හිමිකම පිළිබඳ දැනුම්දීම.**

පහත සඳහන් ඕනෑම සිදුවීමක් ඔබ විසින් අප වෙත නොපමාව දැනුම් දිය යුතුය:

(අ) හිමිකම්පෑමකට තුඩුදිය හැකි ඕනෑම අනතුරක්
(ආ) සිවිල් හෝ අපරාධ නඩු විභාගයක්

සොරකමක් සිදුව ඇත්නම්, ඔබ විසින් හැකි ඉක්මණින් පොලීසියට දැනුම් දිය යුතුය.

**(3) හිමිකමක් පිළිබඳව කටයුතු කිරීම.**

අලාභයක්, හානියක් හෝ තුවාලයක් ඇතිකළ සිද්ධියකදී:

(අ) අප ඔබගේ නමින් විත්තිය භාරගෙන කටයුතු කිරීම හෝ ඔබට එරෙහිව ඇති හිමිකම සමථයට පත්කිරීමට කටයුතු කිරීම කරනු ඇත. අධිකරණමය ක්‍රියාවලියෙහි නිරත වීමෙහි සහ හිමිකම් ඉල්ලීම සමථයට පත් කිරීමේ පූර්ණ අභිමතය අප සතුය.

(ආ) අප ඉල්ලා සිටින සියලුම තොරතුරු සහ සහාය ලබාදීම ඔබ විසින් කළ යුතුය. අපගේ ලිඛිත අනුමැතියකින් තොරව ඔබ විසින් වගකීම භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම, ගෙවීමක් පිළිබඳව සාකච්ඡා කිරීම හෝ පොරොන්දු වීම නොකළ යුතුය. අපි අපගේ අනුමැතිය ලබාදීම අසාධාරණ ලෙස අත්හිටුවීම නොකරනු ඇත.

**(4)** රක්ෂණය කර ඇති වාහනයකට යම් හානියක් සිදුවන අවස්ථාවේදී ඔබ විසින් ප්‍රකාශ කර ඇති වටිනාකමට වඩා වර්තමාන වෙළඳපොළ වටිනාකම වැඩිවුවහොත්, ඒ වෙනසෙහි ප්‍රමාණය සඳහා රක්ෂකයා වශයෙන් ඔබ සලකනු ලබන අතර, හානියෙහි ප්‍රමාණානුකූල කොටසක් ඔබ විසින් භාරගත යුතු වේ. එක් වාහනයකට වඩා වැඩි වාහන ගණනක් රක්ෂණය කර ඇති විට එක් එක් වාහනයට පෙර කොන්දේසි බල පැවැත් වේ.

**(5) අවලංගු කිරීම**

අවසන් වශයෙන් අප දන්නා ඔබගේ ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් දින හතක දැනුම්දීමකින් අපට මෙම ඔප්පුව අවලංගු කළ හැකිය. එවන් අවස්ථාවකදී ඔප්පුව බලපැවැත්වූ කාලසීමාව සඳහා අනුප්‍රමාණික වාරිකයක් තබාගෙන ඉතිරි මුදල ඔබට ආපසු ගෙවනු ඇත. අපට ලිඛිතව දැනුම්දීමක් කිරීමෙන් සහ බල පවත්නා රක්ෂණ සහතිකය ආපසු භාරදීමෙන් ඔබටද ඔප්පුව අවලංගු කරවා ගත හැකිය. ඔප්පුව බලපැවැත්වූ කාලසීමාව සඳහා කෙටිකාලීන ප්‍රමාණයන් අනුව ගණනය කළ මුදල රඳවාගෙන ඉතිරි මුදල ඔබ වෙත ආපසු ගෙවනු ඇත. එසේ වුවද හැමකල්හි වාරිකය ආපසු ගෙවීම අදාල වනුයේ අවලංගු කිරීමට පෙර හිමිකම්පෑමක් නොමැත්තේ නම් පමණි.

## <u>රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීම:</u>

### වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම

- රක්ෂණ ඔප්පුව මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වළක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.
- ඔප්පු කාලසීමාවේදී:- රක්ෂිත අවදානම් හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගමට දැනුම් දෙන්න.

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 10, "කොන්දේසි" යටතේ කරුණු අංක 06 බලන්න)*

### හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම:-

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.

  *(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 9, "කොන්දේසි" යටතේ කරුණු අංක 04 බලන්න)*

- වාරික ගෙවීම:- ඔප්පුවේ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයට අනුව විය යුතුය.

  *(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 11, "කොන්දේසි" යටතේ කරුණු අංක 12 බලන්න)*

## <u>වාරික ගෙවීමේ ක්‍රමය:</u>

ඔප්පුව සඳහා වාරිකය සහ ඉන් අනතුරුව කෙරෙන අලුත් කිරීමකදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්) වාර්ෂිකව ගෙවිය යුතුය.

## <u>වංචාව:</u>

රක්ෂිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන කිසියම් හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් පදනම් විරහිත, වංචනික හෝ හිතාමතාම අතිශයෝක්තියෙන් දක්වා ඇත්නම්, හෝ එයට සාධක වශයෙන් ව්‍යාජ ප්‍රකාශ කර ඇත්නම්, මේ යටතේ කිසිදු හිමිකම් පෑමක් ගෙවනු නොලැබේ.

## <u>පැමිණිලි ක්‍රියා පටිපාටිය:-</u>

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටිමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය:

- දුරකථනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011 2126136
- ඊ-මේල් හරහා - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් හරහා - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපෑලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය හරහා - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න
- අප කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි ආකාරය
iii. යොමුව: ඔප්පු අංකය / වාහන අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න

*(පැමිණිලි හැසිරවීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 21 බලන්න)*

**ආරවුල් විසඳීම:-**

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-
ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
අංක 143 ඒ, වජිර පාර, කොළඹ 05
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-
අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*(පැමිණිලි හැසිරවීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 21 බලන්න)*

**වැදගත් සටහන්:**

1. රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාළ වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්ෂණයට අදාළ ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්ෂණ ඔප්පුවේ ඉංග්‍රීසි මුද්‍රණයේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

**වැඩිදුර තොරතුරු සඳහා:**

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකථනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයක් වෙත පැමිණීමෙන්